# ප්‍රධාන වියදම් සංරචක

## 2024 අයවැය ඇස්තමේන්තුව

### ( අයවැය යෝජනා ඇතුළත්ව)

### (අනුමත)

මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
ජාතික අයවැය දෙපාර්තමේන්තුව
දෙසැම්බර් 2023

## 2024 වියදම් සංරචක අනුව සංක්ෂිප්ත අයවැය ඇස්තමේන්තුව

2024 වර්ෂය සඳහා වන වියදම් ඇස්තමේන්තු සඳහා පාර්ලිමේන්තු අනුමැතිය දැනටමත් හිමිවී ඇත. ඒ අනුව අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා විශේෂ වියදම් ඒකක යටතේ දක්වා ඇති වියදම්, කාර්යයන් අනුව ප්‍රධාන වියදම් සංරචක ලෙස අමාත්‍යාංශ අනුව සවිස්තරාත්මකව මෙහි ඇතුළත් කර ඇත.

මෙවර අයවැය සකස් කිරීමේදී දැනටමත් ක්‍රියාත්මක වන සුභසාධන, සංවර්ධන ව්‍යාපෘති හා වැඩසටහන් අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය මූල්‍ය අවකාශය සළසා දී ඇති අතර ශුන්‍ය පාදක අයවැයකරණ ප්‍රවේශයකින් කටයුතු කරමින් හැකිතාක් තිරසාර භාවිතයන් සහිත ව්‍යාපෘති හා වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පමණක් ප්‍රතිපාදන ඇතුළත් කර තිබේ.

2024 අයවැය ලේඛනයෙහි වියදම් සංරචක අනුව සාරාංශයක් ලෙස මෙහි ඉදිරිපත් කර ඇති වියදම් පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු https://www.treasury.gov.lk/web/budget-estimates වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ලබාගත හැකිය. 2024 අයවැය කතාව මඟින් කරනු ලැබූ අයවැය යෝජනා ද ඇතුලත්ව මෙම ලේඛනය සංශෝධනය කර ඇත.

මෙහි ඇතුළත් ඇතැම් ව්‍යාපෘති හා වැඩසටහන් සඳහා ප්‍රතිපාදන අයවැය ඇස්තමේන්තු මඟින් ද පළාත් සභා සහ අර්ධ රාජ්‍ය ආයතනයන්හි ප්‍රතිපාදන යටතේද සළසා දී ඇත. භාවිතයේ පහසුව සඳහා, ගිණුම් කටයුතු සඳහා වූ ඇස්තමේන්තුවේ ඇතුළත් අගයන් මෙහි ආසන්න රුපියල් මිලියනයට වටයා ඇති හෙයින් එම සංඛ්‍යා අතර සියුම් වෙනස්කම් පැවතිය හැකිය.

# පටුන


| | අමාත්‍යාංශ | පිටු අංකය |
|---|---|---|
| 01. | අධ්‍යාපන අමාත්‍යාංශය | 1 |
| 02. | සෞඛ්‍ය අමාත්‍යාංශය | 5 |
| 03. | කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 7 |
| 04. | ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 10 |
| 05. | වාරිමාර්ග අමාත්‍යාංශය | 13 |
| 06. | ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 15 |
| 07. | නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 17 |
| 08. | ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 19 |
| 09. | වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | 20 |
| 10. | කර්මාන්ත අමාත්‍යාංශය | 21 |
| 11. | ධීවර අමාත්‍යාංශය | 22 |
| 12. | සංචාරක හා ඉඩම් අමාත්‍යාංශය | 24 |
| 13. | වනජීවී සහ වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය | 26 |
| 14. | රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | 27 |
| 15. | මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය | 29 |
| 16. | ආරක්ෂක අමාත්‍යාංශය | 30 |
| 17. | ජනමාධ්‍ය අමාත්‍යාංශය | 32 |
| 18. | අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය | 33 |
| 19. | බුද්ධ ශාසන, ආගමික හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 34 |
| 20. | විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශය | 35 |
| 21. | පරිසර අමාත්‍යාංශය | 38 |
| 22. | වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යාංශය | 39 |
| 23. | කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය | 40 |
| 24. | ක්‍රීඩා හා යෞවන කටයුතු අමාත්‍යාංශය | 41 |
| 25. | කාන්තා, ළමා කටයුතු හා සමාජ සවි බල ගැන්වීම් අමාත්‍යාංශය | 43 |
| 26. | තාක්ෂණ අමාත්‍යාංශය | 44 |
| 27. | මහජන ආරක්ෂක අමාත්‍යාංශය | 45 |
| 28. | විදේශ කටයුතු අමාත්‍යාංශය | 47 |
| 29. | විශේෂ වියදම් ඒකක | 48 |

රු. මි

| අධ්‍යාපන අමාත්‍යාංශය | 239,840 |
|---|---|
| පුනරාවර්තන වියදම් | 181,800 |
| මූලධන වියදම් | 58,040 |
| පුනරාවර්තන වියදම් | |
| • සියළුම සිසුන් සඳහා නොමිලේ පාසල් පෙළපොත් ලබාදීම | 20,000 |
| • සිසුන් 4,556,220ක් සඳහා නොමිලේ පාසල් නිල ඇඳුම් ලබාදීම | 6,000 |
| • දුෂ්කර හා අති දුෂ්කර පාසල්වල ශිෂ්‍යයින් 728,448 ක් සඳහා සපත්තු ලබාදීම | 2,500 |
| • 5 ශ්‍රේණියේ ශිෂ්‍යත්වලාභීන් 135,000 සඳහා ශිෂ්‍යත්ව ලබාදීම | 938 |
| • සියළුම සිසුන් සඳහා සෞඛ්‍ය රක්ෂණාවරණය ලබාදීම (මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 600,000ක් සඳහා) | 2,000 |
| • ශිෂ්‍යයින් 1,081,927 ක් සඳහා පාසල් පෝෂණ වැඩසටහන (රු. මිලියන 16,600 පළාත් සභා සඳහා වන අතර රු.මිලියන 100 ක් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා වේ) | 100 |
| • ජාතික විද්‍යාපීඨ සිසුන් සඳහා දීමනාව | 600 |
| • විභාග පැවැත්වීම හා ඇගයීම | 10,500 |
| • වාර්ෂිකව විශ්වවිද්‍යාල සිසුන් 64,000කට මහපොළ ශිෂ්‍යත්වය ලබා දීම සඳහා සහ විශ්වවිද්‍යාල සිසුන් 36,000ක් සඳහා ශිෂ්‍යාධාර ලබා දීමට රජයේ දායකත්වය (මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 100,000) | 2,500 |
| • වෘත්තීය අධ්‍යාපනය හා පුහුණුව ලබන ශිෂ්‍යයින් සඳහා "නිපුණතා සිසු දිරිය" ශිෂ්‍යත්ව වැඩසටහන | 700 |
| • වෘත්තීය පුහුණු සිසුන් සඳහා වාර ප්‍රවේශපත්‍ර වෙනුවෙන් ප්‍රතිපාදන | 181 |
| • රාජ්‍ය විශ්වවිද්‍යාලවලට ඇතුලත් වීමට නොහැකි වූ සිසුන් සඳහා වන පොලී රහිත ණය යෝජනා ක්‍රමය සඳහා රජයේ දායකත්වය (මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව 18,000) | 2,000 |
| • වැටුප් හා දීමනා | 118,941 |
| *සාමාන්‍ය අධ්‍යාපනය* | *57,753* |
| *උසස් අධ්‍යාපනය* | *54,236* |
| *නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය* | *6,093* |
| *පර්යේෂණ හා නව නිපැයුම්* | *859* |
| • වෙනත් පුනරාවර්තන වියදම් | 14,840 |
| *සාමාන්‍ය අධ්‍යාපනය* | *2,709* |
| *උසස් අධ්‍යාපනය* | *9,264* |
| *නිපුණතා සංවර්ධනය හා වෘත්තීය අධ්‍යාපනය* | *2,406* |
| *පර්යේෂණ හා නව නිපැයුම්* | *461* |

| **මූලධන වියදම්** | |
|---|---|
| • විශේෂ අධ්‍යාපනය සඳහා සහාය | 45 |
| • පිරිවෙන් අධ්‍යාපනය සඳහා සහාය | 150 |
| • ගුරු විද්‍යාල සහ මධ්‍යස්ථාන හා විද්‍යා පීඨ | 305 |
| • ගුණාත්මක අධ්‍යාපන ක්‍රමයක් ස්ථාපිත කිරීම | 8,480 |
| *සාමාන්‍ය අධ්‍යාපන නවීකරණ ව්‍යාපෘතිය* | *3,170* |
| *ද්විතියික අධ්‍යාපන අංශය වැඩිදියුණු කිරීමේ වැඩසටහන* | *1,410* |
| *පාසල් යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය* | *2,500* |
| *ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපනය* | *1,400* |
| • ජාතික අධ්‍යාපන විද්‍යාපීඨ වල තාක්ෂණ විෂය ධාරාව ස්ථාපනය කිරීම | 2,620 |
| • තාක්ෂණික අධ්‍යාපන සංවර්ධනය සඳහා පහසුකම් සැලසීම | 4,262 |
| • ද්විතියික අධ්‍යාපන සඳහා වූ තොරතුරු සන්නිවේදන තාක්ෂණික කේන්ද්‍රස්ථානය පිහිටුවීම | 1,100 |
| • පාසල් පහසුකම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම | 528 |
| • විශ්වවිද්‍යාලවල විද්‍යා, තාක්ෂණ මානව සම්පත් සංවර්ධනය<br>*කැලණිය, රජරට සහ සබරගමුව යන විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ ඉදිකිරීම*<br>*ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨය ඉදිකිරීම*<br>*මොරටුව විශ්වවිද්‍යාලයේ ව්‍යවච්ඡේද විද්‍යා, කායික විද්‍යා හා ජෛව රසායන විද්‍යා දෙපාර්තමේන්තු සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම* | 9,500 |
| • වයඹ විශ්වවිද්‍යාලීය නගර සංවර්ධන ව්‍යාපෘතිය | 3,000 |
| • වයඹ සහ ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලවල තාක්ෂණික පීඨ ඉදිකිරීම | 665 |
| • වෛද්‍ය පීඨවල සහ මහාචාර්ය ඒකකවල යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම | 9,805 |
| *සබරගමුව විශ්වවිද්‍යාලය සඳහා වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරීම* | *4,150* |
| *නැගෙනහිර විශ්වවිද්‍යාලයේ සෞඛ්‍ය ආරක්ෂණ විද්‍යා පීඨය සඳහා ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම* | *1,800* |
| *කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 17ක ගොඩනැගිල්ලක් ස්ථාපිත කිරීම* | *1,850* |
| *කරාපිටිය රෝහලේ මහාචාර්යය ඒකකය ස්ථාපිත කිරීම* | *730* |
| *ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා විද්‍යාගාර පහසුකම් ලබාදීම* | *500* |
| *රුහුණ විශ්වවිද්‍යාලයේ සම සෞඛ්‍ය පීඨය සංවර්ධනය කිරීම* | *475* |
| *රුහුණ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨය සඳහා මහල් 12ක ගොඩනැගිල්ලක් ඉදිකිරීම* | *300* |
| • උසස් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා ආයතනික සහාය ( ශ්‍රී ලංකා උසස් තාක්ෂණ අධ්‍යාපන ආයතනය, , භික්ෂු විශ්වවිද්‍යාලය, බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය) | 300 |
| • උසස් අධ්‍යාපනය කඩිනම් කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය මඟින් ප්‍රමුඛතා විෂයයන් සඳහා බඳවා ගැනීම් වැඩි කිරීම සහ උපාධි පාඨමාලා වල ගුණාත්මක බව ඉහළ නැංවීම | 1,000 |

| | |
|---|---|
| • රාජ්‍ය විශ්වවිද්‍යාල සහ අනෙකුත් උසස් අධ්‍යාපන ආයතනයන්හි පර්යේෂණ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම සහ යටිතල පහසුකම් සංවර්ධනය | 7,680 |
| *එයින් පේරාදෙණිය විශ්වවිද්‍යාලය* | *650* |
| *කොළඹ විශ්වවිද්‍යාලය* | *425* |
| *ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය* | *850* |
| *කැලණිය විශ්වවිද්‍යාලය* | *325* |
| *මොරටුව විශ්වවිද්‍යාලය* | *525* |
| *යාපනය විශ්වවිද්‍යාලය* | *400* |
| *රුහුණ විශ්වවිද්‍යාලය* | *250* |
| *විවෘත විශ්වවිද්‍යාලය* | *50* |
| *නැගෙනහිර විශ්වවිද්‍යාලය* | *176* |
| *අග්නිදිග විශ්වවිද්‍යාලය* | *225* |
| *රජරට විශ්වවිද්‍යාලය* | *500* |
| *සබරගමුව විශ්වවිද්‍යාලය* | *400* |
| *වයඹ විශ්වවිද්‍යාලය* | *300* |
| *ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය* | *450* |
| *සෞන්දර්යය කලා විශ්වවිද්‍යාලය* | *275* |
| *ත්‍රිකුණාමල මණ්ඩපය* | *300* |
| *ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය* | *100* |
| *වවුනියා විශ්වවිද්‍යාලය* | *225* |
| *විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව* | *200* |
| *පාලි හා බෞද්ධ අධ්‍යයන පශ්චාත් උපාධි ආයතනය* | *22* |
| *වෛද්‍ය විද්‍යා පශ්චාත් උපාධි ආයතනය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය* | *02* |
| *තාක්ෂණික ආයතනය - මොරටුව විශ්වවිද්‍යාලය* | *25* |
| *ස්වාමි විපුලානන්ද සෞන්දර්යය ආයතනය* | *90* |
| *මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා උසස් අධ්‍යාපන ආයතනය* | *70* |
| • කාර්ය මණ්ඩල පුහුණු හා ස්වයං රැකියා උත්පාදනය ඇතුළු වෘත්තීය පුහුණු කටයුතු වැඩි දියුණු කිරීම | 170 |
| • නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණුව | 956 |
| • තාක්ෂණ විද්‍යාල/ කාර්මික විද්‍යාල 7ක් නවීකරණය කිරීම | 225 |
| • වෘත්තීය හා තාක්ෂණික පුහුණු සංවර්ධන ආයතන - නිපුණතා සංවර්ධන වැඩසටහනේ ඉතිරි වැඩ | 200 |
| • නියාගම වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය ශක්තිමත් කිරීම | 568 |
| • තෘතීය වෘත්තීය අධ්‍යාපන පුහුණු ක්ෂේත්‍රයේ රැකියා සැලසීමේ පසුබිමක් සකස් කිරීමේ ව්‍යාපෘතිය | 660 |
| • කොළඹ වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය සහ ගම්පහ කාර්මික විද්‍යාලය ස්ථාපිත කිරීම | 490 |
| • ජාත්‍යන්තර පර්යේෂණ ආයතනය සමඟ සහයෝගීතාවයෙන් කටයුතු කිරීම සඳහා පර්යේෂණවලට සම්බන්ධ දේශීය ආයතනවලට පහසුකම් සැපයීම | 863 |

| | |
|---|---|
| • පර්යේෂණ සහ නවෝත්පාදන ක්‍රියාකාරකම් ජාතික අරමුණු සමග පෙළ ගැස්වීම සහ නිෂ්පාදනවලට වටිනාකම එකතු කිරීම පිණිස පර්යේෂණවල නිගමනයන්ගෙන් කර්මාන්තවලට ප්‍රතිලාභ ලබා ගත හැකිවන පරිදි පර්යේෂණ - කර්මාන්ත සබඳතා ශක්තිමත් කිරීම | 163 |
| • වෘත්තීය පුහුණු ආයතන වැඩිදියුණු කිරීම හා නඩත්තුව | 767 |
| • කාර්මික විද්‍යාල හා තාක්ෂණ විද්‍යාල වැඩිදියුණු කිරීම | 190 |
| • **අධ්‍යාපන විශ්වවිද්‍යාලය පිහිටුවීම - අයවැය යෝජනා අංක 11** | 1,000 |
| • **පේරාදෙණිය විශ්වවිද්‍යාලය සංවර්ධනය- අයවැය යෝජනා අංක 12** | 500 |
| • **ආසාත්මිකතා සහ ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳ ජාතික විද්‍යායතනය පිහිටුවීම - අයවැය යෝජනා අංක 13** | 40 |
| • **අභ්‍යාසලාභී පුහුණුව තුළින් තොරතුරු හා සන්නිවේදනය තාක්ෂණ ක්ෂේත්‍රයේ කුසලතා සංවර්ධනය - අයවැය යෝජනා අංක 15** | 750 |
| • **සැමට ඉංග්‍රීසි - අයවැය යෝජනා අංක 17** | 500 |
| • වෙනත් මූලධන වියදම් | 558 |

**ඉහත ප්‍රතිපාදනවලට අමතරව පළාත් සභා යටතේ රු. මිලියන 280,000 ක් අධ්‍යාපන අංශයට වෙන් කර ඇත**

රු. මි

| සෞඛ්‍ය අමාත්‍යාංශය | 410,790 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **350,290** |
| **මූලධන වියදම්** | **60,500** |
| **පුනරාවර්තන වියදම්** | |
| • සියලුම රජයේ රෝහල්/ බෙහෙත් ශාලා/ දේශීය වෛද්‍ය ආයතන වෙත උසස් ප්‍රමිතියෙන් යුත් ඖෂධ නොමිලේ ලබාදීම | 180,300 |
| • ත්‍රිපෝෂ වැඩසටහන - මව්වරුන් සහ ළදරුවන් සඳහා  අතිරේක පෝෂණ ආහාර ලබාදීම | 9,000 |
| • සුවසැරිය - 1990 හදිසි ගිලන්රථ සේවය | 4,150 |
| • මධ්‍යම රජයේ රෝහල් සහ පළාත් රෝහල්වල සායනික අපද්‍රව්‍ය කළමනාකරණය | 1,500 |
| • වෛද්‍යවරුන්, හෙද හෙදියන් ආදී සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය | 368 |
| • බෝවන රෝග සහ බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම | 1,006 |
| • රෝහල් උපයෝගිතා සේවා - විදුලිය, ජලය, ආරක්ෂක සේවා, පිරිසිදු කිරීම් සේවා, රෙදි සේදීමේ සේවා ආදිය | 13,565 |
| • රජයේ රෝහල් සහ සෞඛ්‍ය ආයතන සඳහා ඉන්ධන සැපයීම | 5,355 |
| • රෝහල්වල නේවාසික රෝගීන් සඳහා පෝෂ්‍යදායී ආහාර සැපයීම | 5,304 |
| • සෞඛ්‍ය ක්ෂේත්‍රයේ කාර්ය මණ්ඩලය සඳහා නිල ඇඳුම් ලබාදීම | 804 |
| • වෛද්‍ය උපකරණ නඩත්තු කිරීම | 500 |
| • ඩිජිටල් සෞඛ්‍ය තොරතුරු පද්ධති නඩත්තු කිරීම | 200 |
| • ව්‍යවස්ථාපිත මහජන සෞඛ්‍ය ආයතන | 3,502 |
| • සෞඛ්‍ය සේවා නිලධාරීන්ගේ වැටුප් සහ වේතන | 120,659 |
| • වෙනත් මෙහෙයුම් වියදම් | 4,077 |
| **මූලධන වියදම්** | |
| • රෝහල් සඳහා CT, MRI යන්ත්‍ර වැනි නවීන වෛද්‍ය උපකරණ | 8,000 |
| • රෝහල් සඳහා රුධිර බැංකු උපකරණ | 150 |
| • රෝහල් රසායනාගාර සඳහා රසායනාගාර උපකරණ සැපයීම | 1,145 |
| • රෝහල්වල ඇති වෛද්‍ය උපකරණ නඩත්තුව | 4,000 |
| • දිවයින පුරා පිහිටා ඇති රෝහල් ජාලය පුනරුත්ථාපනය කිරීම සහ වැඩිදියුණු කිරීම | 6,665 |
| • රෝහල්වල යටිතල පහසුකම් ශක්තිමත් කිරීම සහ වැඩිදියුණු කිරීම | 1,900 |
| • ව්‍යවස්ථාපිත මහජන සෞඛ්‍ය ආයතන | 435 |
| • වෛද්‍යවරුන්, හෙද හෙදියන් ආදී සෞඛ්‍ය කාර්යය මණ්ඩලයේ මානව සම්පත් සංවර්ධනය | 1,878 |
| • බෝවන රෝග සහ බෝ නොවන රෝග වැළැක්වීම සහ පාලනය කිරීම | 3,233 |
| • ප්‍රාථමික සෞඛ්‍ය සේවා ශක්තිමත් කිරීම | 8,868 |

| | |
|---|---|
| • ගැබිනි මවුවරුන්ගේ සහ දරුවන්ගේ විශේෂ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා විශේෂිත මධ්‍යස්ථාන<br>කොළඹ සාඑල්‍යතා ප්‍රතිකාර ඒකක (ද සොයිසා) සහ ප්‍රජනන ප්‍රතිකාර මධ්‍යස්ථානය (කාසල් වීදිය රෝහල)<br>ළමුන් සඳහා හෘද රෝග මධ්‍යස්ථානය (රිජ්වේ ආර්යා ළමා රෝහල)<br>ප්‍රසව සංකූලතා සහ සංකීර්ණ ගැබ්ගැනීම් කළමනාකරණය කිරීම සඳහා කොළඹ, මහනුවර සහ අනුරාධපුර දිස්ත්‍රික්ක වල විශේෂ වෛද්‍ය මධ්‍යස්ථාන පිහිටුවීම | 2,247 |
| • දිවයින පුරා පිළිකා ප්‍රතිකාර සේවා ව්‍යාප්ත කිරීම සඳහා යටිතල පහසුකම් සහ රේඛීය ත්වරණ උපකරණ (Linear Accelerators) වැනි උපකරණ ලබා දීම | 2,460 |
| • හදිසි ප්‍රතිකාර ඒකක වැඩිදියුණු කිරීම | 427 |
| • ඖෂධ සුරක්ෂිතව ගබඩා කිරීම සඳහා නව ඖෂධ ගබඩා ලබා දීම ආදී වෛද්‍ය සැපයුම් ආශ්‍රිත සේවාවන් ශක්තිමත් කිරීම | 492 |
| • සෞඛ්‍ය සේවා සහ ඩිජිටල් සෞඛ්‍ය පද්ධතිවල වැඩිදියුණු කිරීම් | 4,296 |
| • ආසාදිත ද්‍රව්‍ය සහිත අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ආරක්ෂිත පද්ධති ස්ථාපනය කිරීම | 1,200 |
| • ආඝාත ප්‍රතිකාර සේවා පුළුල් කිරීම සඳහා නවීන තාක්ෂණයන්ගෙන් යුත් ගොඩනැගිල්ලක් ඉදිකිරීම | 200 |
| • තෝරාගත් මූලික රෝහල් හා ප්‍රාදේශීය රෝහල් වල සෞඛ්‍ය පහසුකම් වැඩිදියුණු කිරීම | 3,000 |
| • ධාරිතාව සංවර්ධන හරහා ජෛව විද්‍යා ඉංජිනේරු සේවාව ශක්තිමත් කිරීම | 1,650 |
| • ආයුර්වේදය සහ දේශීය වෛද්‍ය විද්‍යාව ශක්තිමත් කිරීම | 600 |
| • ඒඩ්ස්, ක්ෂය රෝගය හා මැලේරියාව වැනි රෝග වලට එරෙහිව සටන් කිරීමට අවශ්‍ය සහාය ශක්තිමත් කිරීම | 700 |
| • මහජන සෞඛ්‍ය සූදානම් කිරීම සඳහා ජාතික පද්ධතීන් ශක්තිමත් කිරීම | 3,768 |
| • සෞඛ්‍ය පරිපාලනය වැඩිදියුණු කිරීම සඳහා අමාත්‍යාංශ ගොඩනැගිල්ල ඉදිකිරීම | 1,000 |
| • සුවසැරිය - 1990 හදිසි ගිලන්රථ සේවය | 250 |
| • **වෛද්‍ය පර්යේෂණ ආයතනයේ පහසුකම් වැඩි දියුණු කිරීම - අයවැය යෝජනා අංක 18** | 75 |
| • **ජාතික ඖෂධ තත්ත්ව සහතික රසායනාගාරයේ පහසුකම් වැඩිදියුණු කිරීම - අයවැය යෝජනා අංක 19** | 25 |
| • **හෘද පුනර්ජීවන ඒකකය ස්ථාපිත කිරීම - බදුල්ල - අයවැය යෝජනා අංක 20** | 300 |
| • **සුවතා සංචාරක කටයුතු ප්‍රවර්ධනය - අයවැය යෝජනා අංක 21** | 100 |
| • වෙනත් මූලධන වියදම් | 1,434 |

**ඉහත ප්‍රතිපාදනවලට අමතරව පළාත් සභා යටතේ රු. මිලියන 106,000 ක් සෞඛ්‍ය අංශයට වෙන් කර ඇත.**

රු. මි

| කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය | 112,561 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **66,039** |
| **මූලධන වියදම්** | **46,522** |
| **පුනරාවර්තන වියදම්** | |
| • රසායනික සහ කාබනික පොහොර සඳහා පොහොර සහනාධාරය<br>2024 වර්ෂයේ යල සහ මහ කන්නවල කුඹුරු ඉඩම්වල වගා කරනු ලබන සියලු ගොවීන් වෙත පොහොර සහනාධාරය වශයෙන් හෙක්ටයාරයකට රුපියල් 15,000ක් බැගින් වන සේ එක් ප්‍රතිලාභියෙකු වෙත උපරිම වශයෙන් හෙක්ටයාර දෙකක් සඳහා රුපියල් 30,000ක උපරිම මූල්‍ය සහනාධාරයක් ගොවීන්ගේ බැංකු ගිණුම් වෙත සෘජුවම ප්‍රේෂණය කිරීම | 19,500 |
| • කෘෂිකාර්මික සහ ගොවිජන රක්ෂණ ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම<br>වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 175,000 කට ආසන්න ගොවීන් සඳහා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ලෙස ගොවි විශ්‍රාම වැටුපක් ලබා දීම | 5,386 |
| • වැටුප් හා මෙහෙයුම් වියදම්<br><br>කෘෂිකර්ම අමාත්‍යාංශය<br>(කෘෂිකර්ම අමාත්‍යවරයා, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ඇතුලත්ව)<br><br>වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය<br>(වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා සහ දෙපාර්තමේන්තු ඇතුලත්ව) | <br><br>35,229<br><br><br><br><br>2,488 |
| • කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වන ආයතන සඳහා පුනරාවර්තන වියදම්<br>කෘෂිකාර්මික අංශයේ සංවර්ධනය සඳහා ස්ථාපිත ආයතනවල පුනරාවර්තන වියදම් වෙනුවෙන් පහසුකම් සැලසීම | 3,436 |
| **මූලධන වියදම්** | |
| • අපනයනාභිමුඛ වගාවන් සහ කෘෂිකාර්මික භෝග සඳහා අගය එකතු කිරීම් වෙනුවෙන් ගැලපුම් සහනාධාර ලබාදීමේ කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය I | 1,600 |
| • කෘෂිකාර්මික අංශයේ නවීකරණ ව්‍යාපෘතිය II<br>නව්‍ය කෘෂි තාක්ෂණික ක්‍රමවේදයන් හඳුන්වා දෙමින් පවුල් 8,870ක් සවිබල ගැන්වීම, හෙක්ටයාර 12,156ක ප්‍රදේශයක නවීකරණය කරන ලද කෘෂි තාක්ෂණික උද්‍යාන පිහිටුවීම හා යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම | 7,250 |
| • දේශගුණික විපර්යාසයන්ට අනුගත වන කෘෂි වාරි සංවර්ධන ව්‍යාපෘතිය<br>කෘෂි නිෂ්පාදන ඵලදායීතාව ඉහළ නංවා ගනිමින් හා ප්‍රශස්ත ජල භාවිතය තුළින් සුහුරු ලෙස දේශගුණික විපර්යාසයන්ට මුහුණු දිය හැකිවන පරිදි ගොවීන් 12,500ක් පුහුණු කිරීම, යටිතල පහසුකම් වැඩි දියුණු කිරීම<br>(කෘෂි මාර්ග කිලෝමීටර 12ක් සංවර්ධනය කිරීම හා වැව් 132ක්, කෘෂි ළිං 180ක් ප්‍රතිසංස්කරණය කිරීම) | 11,800 |
| • කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගිත්ව වැඩසටහන<br>ග්‍රාමීය කෘෂි ව්‍යවසායකයන් 2,618ක් අතර වාණිජ හවුල්කාරිත්වය ගොඩනැගීම, කෘෂි ව්‍යාපාර අවස්ථා වෙනුවෙන් තරුණ කෘෂි ව්‍යවසායකයන් සඳහා ප්‍රදාන 1,434ක් සැපයීම, ග්‍රාමීය කෘෂි ව්‍යවසායකයන් වෙනුවෙන් ණය 6,980ක් සඳහා ප්‍රවේශය ලබා දීම, තාක්ෂණික දැනුම සහ මූල්‍ය සාක්ෂරතාව වැඩිදියුණු කිරීම | 7,024 |

| | |
|---|---|
| • කුඩා පරිමාණ කිරි නිෂ්පාදකයන්ගේ සමුපකාර සමිති සංවර්ධනය කිරීම<br>කුඩා කිරි නිෂ්පාදනාගාර 06කට අනුබද්ධ කුඩා කිරි සැකසුම් කර්මාන්තශාලා සහ ගොවි සමිති 06ක සැකසුම් කටයුතු අධීක්ෂණය සහ ඇගයීම | 10 |
| • කුඩා කෘෂි ව්‍යාපාර නගා සිටුවීමේ වැඩසටහන<br>දේශගුණික විපර්යාස නිසා ඇති වන බලපෑම්වලට පිළියම් යෙදීම හා ඒවාට අනුගත වීමේ හැකියාව ගොඩනැගීම සහ කෘෂිකර්මාන්තය සඳහා වාණිජකරණය ප්‍රවර්ධනය කරමින් ප්‍රතිලාභී කුටුම්භවල ආදායම 30%කින් ඉහළ නැංවීම | 2,836 |
| • ආහාර සුරක්ෂිතතාව සඳහා විශේෂ වැඩසටහන්<br>වී, මිරිස් , බඩ ඉරිඟු , අර්තාපල්,ලොකු ළූණු, රතු ළූණු, මුං ඇට,<br>රට කජු , සෝයා, කුරක්කන්,කව්පි,තල ,උඳු ආදී භෝග වගා කිරීම සඳහා ගොවීන්ට පහසුකම් සැලසීම, නව තාක්ෂණික භාවිතාවන් ප්‍රවර්ධනය කිරීම තුළින් කෘෂිකාර්මික ඵලදායීතාවය ඉහළ නැංවීම වෙනුවෙන් ව්‍යාප්ති  සේවා  සැපයීම | 300 |
| • බෝග රක්ෂණය සඳහා රජයේ දායකත්වය<br>වී වගාවට උපරිම වශයෙන් හෙක්ටයාර දෙකක් ද අනෙකුත් බෝග වගා (බඩ ඉරිඟු, අර්තාපල්, මිරිස්, ලොකු ළූණු හා සෝයා බෝංචි) සඳහා උපරිම වශයෙන් හෙක්ටයාර එකක් ද වශයෙන් සළකා අක්කරයකට රුපියල් 40,000ක වගා හානි පූර්ණයක් මෙම යෝජනා ක්‍රමය යටතේ සලසනු ලැබේ | 1,000 |
| • ජාතික ශාක නිරෝධායන මධ්‍යස්ථානයේ පරීක්ෂණ පහසුකම් වැඩි දියුණු කිරීම<br>කටුනායක, රත්මලාන, මත්තල, පලාලි ශාක නිරෝධායන මධ්‍යස්ථානයන්හි පිහිටුවා ඇති ශාක නිරෝධායන ඒකකවලින් නිකුත් කරන “ආනයනය හා අපනයනය කරනු ලබන ශාක සඳහා නිරෝධායන සහතික” සඳහා විද්‍යුත් ගෙවීම් හා අදාළ අනෙකුත් පහසුකම් වැඩිදියුණු කිරීම | 14 |
| • පසුගාමී ග්‍රාමීය ප්‍රදේශයන්හි බෝග වගාව ප්‍රවර්ධනය කිරීම සහ පශු සම්පත් සංවර්ධනය<br>පසුගාමී ප්‍රදේශවල උඳු, මුං වැනි බෝග වගා වෙනුවෙන් ප්‍රතිලාභීන් 29,500ක් සඳහා බීජ සැපයීම | 150 |
| • කුඩා හා මධ්‍ය පරිමාණ පශු සම්පත් සංවර්ධනය<br>කුඩා පරිමාණ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය වෙනුවෙන් පහසුකම්  සැලසීම හා ගෘහස්ථ<br>කුකුළු පාලනය ඇතුළු සත්ත්ව පාලන ප්‍රවර්ධන වැඩසටහන් සඳහා පහසුකම් සැපයීම | 250 |
| • එළු පාලනය තුළින් ජීවනෝපාය සංවර්ධනය<br>ප්‍රතිලාභීන් සඳහා ගෘහස්ත එළු පාලනය ප්‍රවර්ධනය කිරීම වෙනුවෙන් එළු පැටවුන් ලබා දීම හා අවශ්‍ය අනෙකුත් යෙදවුම් සඳහා පහසුකම් සැලසීම | 200 |
| • කුඩා වාරිමාර්ග, ග්‍රාමීය වැව්, ඇළ මාර්ග පද්ධති සහ පුරන් කුඹුරු ඉඩම් සංවර්ධනය කිරීම<br>අතහැර දමා ඇති පුරන් කුඹුරු නැවත වගා කිරීම,  සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම ප්‍රතිසංස්කරණය කිරීම, ගොවිජන සංවර්ධන කටයුතු ඩිජිටල්කරණයට පහසුකම් සැලසීම | 3,000 |
| • බෝග විවිධාංගීකරණය<br>බෝග විවිධාංගීකරණය ප්‍රවර්ධනය වෙනුවෙන් ප්‍රශස්ත ජල කළමනාකරණ භාවිතාවන් හා අනුෂාංගික පහසුකම් සඳහා ඉඩ ප්‍රස්ථා සැලසීම | 50 |
| • ප්‍රාදේශීය ගොවිජන සේවා මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම<br>දිවයින පුරා පිහිටි ප්‍රාදේශීය ගොවිජන සේවා මධ්‍යස්ථානවලින් ගොවිජනතාවට සැලසෙන සේවාවන් වඩාත් කාර්යක්ෂම ලෙස සැපයීමට අවශ්‍ය පහසුකම් සම්පාදනය කිරීම | 600 |

| | |
|---|---|
| • කෘෂිකර්ම පර්යේෂණ හා සංවර්ධන කටයුතු<br>ජාතික කෘෂිකර්ම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම හා කෘෂිකර්ම ක්ෂේත්‍රයේ උන්නතිය වෙනුවෙන් නව තාක්ෂණික ක්‍රම හඳුන්වා දීම | 440 |
| • කෘෂිකර්ම ව්‍යාප්ති සේවා හා පුහුණු කිරීම්<br>ප්‍රශස්ත කෘෂිකර්ම භාවිතාවන් ප්‍රවර්ධනය කිරීම, බටඅත හා ගන්නෝරුව කෘෂි තාක්ෂණික ආදර්ශ උද්‍යාන ලෙස වැඩිදියුණු කිරීම | 270 |
| • කෘෂිකර්ම විද්‍යාල වැඩිදියුණු කිරීම<br>දිවයින පුරා පිහිටි කෘෂිකර්ම විද්‍යාලවල පහසුකම් වැඩිදියුණු කරමින් කෘෂි අධ්‍යාපන ඉඩප්‍රස්ථා පුළුල් කිරීම | 298 |
| • බීජ සහතිකකරණය හා පැළෑටි සංරක්ෂණය<br>ප්‍රමිතියෙන් යුතු ගුණාත්මක බීජ සහ රෝපණ ද්‍රව්‍ය ලබා දීම මඟින් කෘෂිකාර්මික නිෂ්පාදන ඉහළ නැංවීම | 858 |
| • බීජ නිෂ්පාදන හා මිලදී ගැනීමේ ජාතික වැඩසටහන<br>ගොවි ජනතාවට ගුණාත්මක බීජ සැපයීම සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම වෙනුවෙන් යෙදවුම් සැපයීම හා ඒ වෙනුවෙන් ආයතනික ක්‍රියාකාරී ව්‍යුහයන් ශක්තිමත් කිරීම | 1,320 |
| • පශු සම්පත් අංශයේ රෝග පාලනය කිරීම සඳහා පහසුකම් වැඩි දියුණු කිරීම<br>වන සතුන්ගෙන් ඇති විය හැකි රෝගවලින් පශු සම්පත ආරක්ෂා කිරීමට අවශ්‍ය පහසුකම් සැලසීම හා සතුන්ට බෝවිය හැකි රෝග පිළිබඳව දැනුම්වත් කිරීමේ යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම | 227 |
| • පශු සම්පත් සංවර්ධනය හා පුහුණුව<br>සත්ත්ව අභිජනනය වෙනුවෙන් පහසුකම් සැලසීම, සත්ත්ව නිෂ්පාදන අපනයනය දිරිමත් කිරීම, සත්ත්ව පාලන ඩිප්ලෝමාධාරීන් පුහුණු කිරීම හා හැකියා වර්ධනය, රජයේ පශු වෛද්‍ය කාර්යාල වැඩිදියුණු කිරීම | 359 |
| • **කෘෂි හා ධීවර නවීකරණ මණ්ඩලය ශක්තිමත් කිරීම - අයවැය යෝජනා අංක 22** | 2,500 |
| • පර්යේෂණය සහ සංවර්ධනය ( තේ, රබර් සහ පොල් ආශ්‍රිත) | 60 |
| • තේ නව වගාව, නැවත වගාව හා පාළු සිටුවීම සඳහා සහනාධාර ලබාදෙමින් කුඩා තේ වගාව දිරිමත් කිරීම | 500 |
| • ප්‍රාදේශීය වැවිලි සමාගම් යටතේ පාලනය වන වතු ඉඩම්වල වට මිනුම් කටයුතු සිදු කර කඩඉම් සිතියම් සකස් කිරීම | 50 |
| • රබර් නව වගාව, නැවත වගාව හා පාළු සිටුවීම සඳහා සහනාධාර ලබා දෙමින් සුළු හා මධ්‍ය පරිමාණ රබර් වගාකරුවන් දිරිමත් කිරීම | 500 |
| • සහනාධාර වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සුළු හා මධ්‍ය පරිමාණ පොල් වගාකරුවන් දිරිමත් කිරීම | 500 |
| • ආයතන සමග සම්බන්ධීකරණයෙන් යුතුව සුළු අපනයන බෝග වගා කිරීම දිරිමත් කිරීම සඳහා යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කිරීම සහ අගය එකතු කළ නිෂ්පාදන ප්‍රවර්ධනය කිරීම | 400 |
| • තේ හා රබර් වගාව ව්‍යාප්ත කිරීම සඳහා වගාකරුවන් වෙත සහනාධාර ලබාදීමේ කුඩා තේ, රබර් වතු හිමියන් සඳහා වූ පුනර්ජීවන ව්‍යාපෘතිය | 278 |
| • අපනයනාභිමුඛ වගාවන් සහ කෘෂිකාර්මික භෝග සඳහා අගය එකතු කිරීම් වෙනුවෙන් ගැලපුම් සහනාධාර ලබාදීමේ කෘෂිකාර්මික අංශ නවීකරණ ව්‍යාපෘතිය | 1,625 |
| • වෙනත් මූලධන වියදම් | 253 |

රු. මි

| ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යාංශය | 417,184 |
|---|---|
| පුනරාවර්තන වියදම් | 48,839 |
| මූලධන වියදම් | 368,345 |
| **පුනරාවර්තන වියදම්** | |
| • පාසල් වාර ප්‍රවේශ පත්‍ර, සන්නද්ධ හමුදා සඳහා වූ නිදහස් ගමන් බලපත්‍ර සහ ලාභ නොලබන මාර්ගවල ධාවනය වන බස්රථ සඳහා සහනාධාර (මසකට වාර ප්‍රවේශ පත්‍ර 536,000, සන්නද්ධ හමුදා සඳහා නිදහස් ගමන් බලපත්‍ර වාර්ෂිකව 29,000 , දිනකට කි.මී. 271,000 ක් සඳහා ආර්ථික වශයෙන් ඵලදායී නොවන මාර්ගවල බස් 1,500 ක් ධාවනය කිරීම) | 12,900 |
| • දිවයින පුරා ප්‍රවාහන සේවා සාක්ෂාත් කර ගැනීම සඳහා බස් රථ 1,560 ක් සිසු සැරිය, ගැමි සැරිය සහ නිසි සැරිය රාත්‍රී සේවා සඳහා යෙදවීම | 2,000 |
| • වැටුප් හා වේතන<br>*එයින් - ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩල සඳහා වැටුප් හා වේතන* | 12,997<br>*11,941* |
| • වෙනත් පුනරාවර්තන වියදම්<br>*එයින් - දුම්රිය මෙහෙයුම් කටයුතු සඳහා ඉන්ධන* | 20,942<br>*15,306* |
| **මූලධන වියදම්** | |
| **මහාමාර්ග අංශය** | |
| • දිවයින පුරා පිහිටි මාර්ග ජාලය කි.මී. 12,000 කට වඩා සහ පාලම් 4,500 ක් පමණ විධිමත්ව නඩත්තු කිරීම **(අයවැය යෝජනා අංක 10 යටතේ, 'ස්වභාවික ආපදා හේතුවෙන් හානි වූ මාර්ග සහ පාලම් ප්‍රතිසංස්කරණය කිරීම ' සඳහා වෙන් කරන ලද රු.මි. 2,000ක ප්‍රතිපාදන මෙහි ඇතුලත් කර ඇත)** | 26,000 |
| • කි.මී.37 ක පමණ දිගින් යුත් මධ්‍යම අධිවේගී මාර්ගය පළමුවන අදියර කඩවත සිට මීරිගම දක්වා ඉදිකිරීම | 52,340 |
| • කි.මී.12 ක පමණ දිගින් යුත් මධ්‍යම අධිවේගී මාර්ගය තුන්වන අදියර පොතුහැර සිට රඹුක්කන දක්වා ඉදිකිරීම | 20,830 |
| • රුවන්පුර අධිවේගී මාර්ගයේ කහතුඩුව සිට ඉංගිරිය කොටසේ අත්පත් කරගත් ඉඩම් සඳහා වන්දි ගෙවීම | 2,503 |
| • ඉඟුරුකඩේ හන්දිය සිට වරාය නගරය දක්වා කුළුණු මත ඉදිකෙරෙන කි.මී. 5.3 ක පමණ දිගින් යුත් අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව සිදු කිරීම | 20,100 |
| • බාලදක්ෂ මාවත සහ චිත්තම්පලම් ඒ. ගාඩිනර් මාවත සම්බන්ධ කිරීමට උත්තරානන්ද මාවත සහ ජස්ටිස් අක්බාර් මාවතේ දුම්රිය මාර්ගයට ඉහළින් සහ කොහුවල හා ගැටඹේ ගුවන් පාලම් පහක් ඉදිකිරීම | 4,000 |
| • පේරාදෙණිය-බදුල්ල-චෙන්කල්අඩි මාර්ගයේ කි.මී. 147 ක පමණ දිගින් යුත් බදුල්ල සිට චෙන්කල්අඩි දක්වා කොටස ප්‍රතිසංස්කරණය කිරීම | 6,075 |
| • කෘෂිකාර්මික අගය දාමය සමග ග්‍රාමීය මාර්ග ජාලය කි.මී. 1,000 ක් පමණ සංවර්ධනය කිරීම | 14,552 |
| • පාලම් 6 ක් ද ඇතුළත්ව ඔරුගොඩවත්ත- අඹතලේ මාර්ගයේ කි.මී.7.4ක්, මහරගම-පිළියන්දල මාර්ගයේ කි.මී. 5.4ක් සහ කොට්ටාව- තලගල මාර්ගයේ කි.මී. 14.5ක් සංවර්ධනය කිරීම සහ කුරිච්චන්කනි පාලම ඉදිකිරීම | 3,135 |

| | |
|---|---|
| • ප්‍රධාන මාර්ග සහ අධිවේගී මාර්ග වෙත ප්‍රවේශ වීම සඳහා විකල්ප මාර්ග ජාලයක් සංවර්ධනය කිරීම යටතේ දැනටමත් ආරම්භ කර ඇති මාර්ගයන්හි තීරණාත්මක ක්‍රියාකාරකම් අවසන් කිරීම සහ එම මාර්ග රථවාහන ධාවනයට සුදුසු මට්ටමට වැඩි දියුණු කිරීම | 43,025 |
| • මධ්‍යම අධිවේගී මාර්ගයේ 2 කොටස වන මීරිගම සිට කුරුණෑගල දක්වා කොටස, කැලණි ගඟ හරහා නව පාලම, සමුද්‍ර මාවත සහ බේස් ලයින් මාර්ගය දීර්ඝ කිරීම සහ නව කැලණි පාලමේ සිට අතුරුගිරිය දක්වා කුළුණු මත ඉදි කරන අධිවේගී මාර්ගය ඉදිකිරීම සඳහා අත්පත් කර ගත් ඉඩම්වලට අදාළ බිල්පත් පියවීම | 8,464 |
| • මහනුවර බහුවිධ ප්‍රවාහන පර්යන්තය ඉදි කිරීම | 11,305 |
| • ග්‍රාමීය මාර්ග සහ ග්‍රාමීය ප්‍රදේශවල පාලම් ප්‍රතිසංස්කරණය කිරීම සහ වැඩිදියුණු කිරීම සම්බන්ධ තීරණාත්මක ක්‍රියාකාරකම් අවසන් කිරීම **( අයවැය යෝජනා අංක 09 යටතේ, 'ග්‍රාමීය මාර්ග නඩත්තුව සහ කළමනාකරණය' සඳහා වෙන් කරන ලද රු.මි. 10,000ක ප්‍රතිපාදන මෙහි ඇතුලත් කර ඇත)** | 11,300 |
| • A 17 මාර්ගයේ රක්වාන සිට සූරියකන්ද දක්වා කිලෝමීටර් 18 ක පමණ කොටස ප්‍රතිසංස්කරණය කිරීම | 1,600 |
| • ජාතික මහාමාර්ගවල පාලම් 25 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 2,550 |
| • මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ලබාගත් ණය ආපසු ගෙවීම | 80,430 |
| • මධ්‍යම සහ ඌව පළාත්වල මාර්ග සහ පාලම් පුළුල් කිරීම හා වැඩිදියුණු කිරීමට අදාළ බිල්පත් පියවීම | 3,590 |
| • සම්පූර්ණ කරන ලද හා ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම | 5,500 |
| • **මහනුවර බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයට ප්‍රවේශවන මාර්ග සංවර්ධනය - අයවැය යෝජනා අංක 36** | 1,500 |
| • වෙනත් මූලධන වියදම් | 1,307 |
| **ප්‍රවාහන අංශය** | |
| • බස් රථ ඇණිය වැඩි දියුණු කිරීම සඳහා බස් එන්ජින්, ගියර් පෙට්ටි, බස් බොඩි අළුත්වැඩියා කිරීම | 1,500 |
| • මාහෝ- ඕමන්ත දුම්රිය මාර්ගයේ කි.මී. 130ක් සහ මහනුවර-පේරාදෙණිය-කඩුගන්නාව දුම්රිය මාර්ගයේ කි.මී.10ක් ප්‍රතිසංස්කරණය කිරීම සහ නව පීලි සහ සිල්පර කොටන් භාවිතා කරමින් දුම්රිය මාර්ග කි.මී. 78 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 13,182 |
| • දුම්රිය මගී මැදිරි, දුම්රිය එන්ජින්, සංඥා පද්ධති සහ මාර්ග අළුත්වැඩියා කිරීම | 7,310 |
| • දුම්රිය ස්ථාන 340 ක ප්‍රවේශ පත්‍ර සහ ආසන වෙන් කිරීම සඳහා විද්‍යුත් ටිකට් පත් ක්‍රමය හඳුන්වා දීම | 14,050 |
| • කැළණි වැලි දුම්රිය මාර්ගය දෙපස ජීවත්වන පවුල් නැවත පදිංචි කිරීම | 790 |
| • දුම්රිය ඇණිය ශක්තිමත් කිරීම සඳහා මගී මැදිරි 160ක්, ඩීසල් බහුකාර්ය ඒකක 2 ක්, ට්‍රැක් වැගන් 20ක් සහ ටැන්ක් වැගන් 30 ක් මිලදී ගැනීම | 1,380 |
| • ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සඳහා බස්රථ 600 ක් මිල දී ගැනීම සහ එම රථ ග්‍රාමීය ජනතාවගේ පහසුව සඳහා යෙදවීම | 3,200 |
| • පැරණි මගී දුම්රිය මැදිරි 200 ක් අළුත්වැඩියා කිරීම සහ මගී ප්‍රවාහනයට එක් කිරීම | 500 |
| • කැලණි ගඟට ඉහළින් ඇති දුම්රිය පාලම ඇතුළු පාලම් ඉදිකිරීම සහ පුනරුත්ථාපනය | 300 |
| • නව සිල්පර නිෂ්පාදනය සහ ඒවා යොදා ගෙන දුම්රිය මාර්ග පුනරුත්ථාපනය කිරීම | 2,625 |

| | |
|---|---|
| • දුම්රිය මාර්ග සංවර්ධනය - රාගම සිට පුත්තලම, කැලණිවැලි සහ මහනුවර - පේරාදෙණිය - කඩුගන්නාව | 265 |
| • රියදුරු බලපත්‍ර නිකුත් කිරීමට පහසුකම් සැලසීම | 1,200 |
| • වාහන ලියාපදිංචි කිරීම සඳහා තොරතුරු තාක්ෂණය මත පදනම් වූ ඉ-මෝටරින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | 45 |
| • වෙනත් මූලධන වියදම් | 1,892 |

රු. මි

| වාරිමාර්ග අමාත්‍යාංශය | 86,500 |
| --- | --- |
| **පුනරාවර්තන වියදම්** | **8,574** |
| **මූලධන වියදම්** | **77,926** |
| **පුනරාවර්තන වියදම්** | |
| • වැටුප් හා මෙහෙයුම් වියදම්<br>( වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ පුනරාවර්තන වියදම් ද ඇතුළත්ව) | 8,574 |
| **මූලධන වියදම්** | |
| • ප්‍රධාන හා මධ්‍යම ප්‍රමාණයේ වාරිමාර්ග පද්ධතිවල අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු හා පුනරුත්ථාපනය කිරීම<br>දිවයින පුරා පිහිටි ප්‍රධාන වාරි පද්ධති 80ක ( හෙක්ටයාර් 215,436) , මධ්‍යම වාරි පද්ධති 161 ක (හෙක්ටයාර් 22,872) , අමුණු 113ක (හෙක්ටයාර් 64,772) නඩත්තු කටයුතු හා පුනරුත්ථාපන කටයුතු සිදු කිරීම | 7,850 |
| • කුඩා වැව් හා ඇළ මාර්ග පුනරුත්ථාපනය කිරීම යටතේ එල්ලංගා පද්ධති මගින් ග්‍රාමීය වැව් වැඩිදියුණු කිරීමෙන් වගා කටයුතු සඳහා වාරි ජල පහසුකම් සැලසීම<br>අනුරාධපුරය, වව්නියාව, ත්‍රිකුණාමලය, මන්නාරම, පුත්තලම, කුරුණෑගල, පොලොන්නරුව ආදී දිස්ත්‍රික්ක වල ග්‍රාමීය වාරි පද්ධති 235 ක් පුනරුත්ථාපනය කිරීම හා ග්‍රාමීය වාරි පද්ධති 454ක බෝග තීව්‍රතාවය වැඩි කිරීම | 2,531 |
| • දේශගුණික විපර්යාසයන්ට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීමේ හා ගංවතුර අවම කිරීමේ ව්‍යාපෘති<br>කොළඹ, ගම්පහ සහ කෑගල්ල දිස්ත්‍රික්ක වල කාලගුණය, ගංවතුර සහ නායයෑම් අනාවැකි සහ පූර්ව අනතුරු ඇඟවීම් වැඩිදියුණු කිරීම.<br>ලවණතා බාධකයක් හරහා පානීය ජලයට ලවණ ජලය ඇතුළු වීම වළක්වා ලීම තුළින් කොළඹ දිස්ත්‍රික්කයේ පුද්ගලයින් 1,000,000 කට පමණ ස්ථායී සහ පිරිසිදු පානීය ජල සැපයුමක් ලබා දීම.<br>ගංවතුර බලපෑම් අවම කිරීම, ජල කළමනාකරණයේ මෙහෙයුම් සහ සම්ප්‍රේෂණ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම. | 9,189 |
| • උමා ඔය හැරවීමේ ව්‍යාපෘතිය නිම කිරීමට අදාළ ගෙවීම් කටයුතු | 5,500 |
| • කෘෂිකාර්මික කටයුතු සංවර්ධනය කිරීම සඳහා වාරි මාර්ග පද්ධති පුළුල් කිරීම, වැඩි දියුණු කිරීම හා පානීය ජල සම්පාදන ව්‍යාපෘති සඳහා වැව් ඉදිකිරීම | 34,767 |
| • ජල සංරක්ෂණය සඳහා නව ජලාශ ඉදිකිරීම<br>යෝධ වැව, අකිතමුරුප්පු, බත් මැඩිල්ල සහ මිණිපේ වැව් වාරිමාර්ග යෝජනා ක්‍රම යටතේ යල සහ මහ කන්නය සඳහා වාරි ජලය ලබා දීම<br>වව්නියාව,මන්නාරම,හා අනුරාධපුර දිස්ත්‍රික්කවල වෙසෙන ජනතාවට පානීය ජලය හා පාවෙන සූර්ය බලාගාරයක් ඉදිකර විදුලිය ජාතික විදුලිබල පද්ධතියට එකතු කිරීම<br>**(අයවැය යෝජනා අංක 31 යටතේ, 'පහල මල්වතු ඔය ව්‍යාපෘතිය' සඳහා වෙන් කරන ලද රු. මි. 2500 ක ප්‍රතිපාදන මෙහි ඇතුලත් වේ )** | 4,390 |

| | |
|---|---|
| • ජලාශ සඳහා ඉඩම් අත්පත් කර ගැනීම වෙනුවෙන් වන්දි ගෙවීම<br>අනුරාධපුරය, ත්‍රිකුණාමලය, දිස්ත්‍රික්කවල පවුල් 2,520 ක් සඳහා වන්දි ගෙවීම<br>ලග්ගල, පල්ලේගම,නා උල, කන්තලේ ,මැදිරිගිරිය යන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වල ඉඩම් අත්පත් කර ගැනීම සහ වන්දි ගෙවීම<br>රිදීමාලියද්ද හා බදුල්ල ප්‍රදේශවල පවුල් 275 ක් සඳහා ඉඩම් බෙදා දීම, ඉඩම් සංවර්ධනය කිරීම, නැවත පදිංචි කිරීමේ කටයුතු සිදු කිරීම සහ පවුල් 300 ක් සඳහා වන්දි ලබා දීම | 7,542 |
| • වෙනත් මූලධන වියදම් | 6,157 |

රු. මි

| ජල සම්පාදන සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යාංශය | 72,850 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,426** |
| **මූලධන වියදම්** | **71,424** |
| **පුනරාවර්තන වියදම්** | |
| • වැටුප් හා මෙහෙයුම් වියදම් | 1,426 |
| **මූලධන වියදම්** | |
| • විශාල ඉල්ලුමක් පවතින ප්‍රදේශවලට මහා පරිමාණ ජල සැපයුම් යෝජනා ක්‍රම සම්පූර්ණ කිරීම මගින් නළ ජල පහසුකම් ලබාදීම යටතේ ජල සම්බන්ධතා මිලියන 3ක් පමණ ලබාදීම<br>හෝමාගම, පාදුක්ක, ඉංගිරිය සහ කළුතර ප්‍රදේශවලට ජල සම්බන්ධතා 75,000 ක් සැපයීම<br>අනුරාධපුර දිස්ත්‍රික්කයේ මැදවච්චිය, පිහිඹියගොල්ලෑව සහ රඹෑව ප්‍රදේශවල ජල සම්බන්ධතා 92,000 ක් ලබා දීම<br>රුවන්වැල්ල ප්‍රදේශයේ ජල සම්බන්ධතා 6,500 ක් ලබා දීම<br>හාරිස්පත්තුව, පූජාපිටිය, පාතදුම්බර සහ අකුරණ ජල සම්බන්ධතා 72,000 ක් ලබා දීම<br>හෙම්මාතගම ප්‍රදේශයේ ජල සම්බන්ධතා 169,000ක් ලබා දීම<br>ගම්පහ, අත්තනගල්ල සහ මිනුවන්ගොඩ ජල සම්බන්ධතා 2,000,000 ක් ලබා දීම<br>යාපනය, නල්ලූර්, වේලානි, කයිට්ස්, පලෙයි සහ චාන්කානයි ප්‍රදේශවල ජල සම්බන්ධතා 60,000 ක් ලබා දීම | 29,710 |
| • අන්තර් පළාත් ජල සැපයුම් යෝජනා ක්‍රම | 300 |
| • අඹතලේ ජල පිරිපහදුවේ ධාරිතාවය වැඩිකිරීම සහ ගොතටුව ජලාශය ඉදිකිරීම | 5,030 |
| • කොළඹ නගරයේ කොළඹ උතුර, කොළඹ නැගෙනහිර, කොළඹ දකුණ සහ කොළඹ බස්නාහිර ප්‍රදේශවල ආදායම් නොලබන ජලය (NRW) 49% සිට 18% ක් දක්වා අඩු කිරීමේ අරමුණින් ක්‍රියාත්මක කරනු ලබන මහ කොළඹ ජල සහ අප ජල කළමනාකරණ ආයෝජන වැඩසටහන | 8,780 |
| • ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන 2024 වන විට ප්‍රජා පාදක ජල සම්පාදන යෝජනා ක්‍රම මගින් නව ජල සම්බන්ධතා 244,436ක් ලබාදීම | 1,250 |
| • උතුරු පළාත, උතුරු මැද පළාත, වයඹ පළාත සහ නැගෙනහිර පළාතේ අම්පාර දිස්ත්‍රික්කය ආවරණය කරමින් වැසි ජලය රැස් කිරීමේ ටැංකි 1,000ක් ස්ථාපිත කිරීම | 50 |
| • නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක්වී ඇති ප්‍රදේශවල ජලය මගින් ඇතිවන රෝග වැළැක්වීම සඳහා උතුරු, උතුරු මැද, වයඹ, මධ්‍යම, සබරගමුව, ඌව සහ දකුණු පළාත් ආවරණය කරමින් පොදු ස්ථාන 52ක සහ පාසල් 80ක ජල පිරිපහදු උපකරණ ස්ථාපිත කිරීම | 150 |
| • කටුනායක, මීගමුව, ගාල්ල, උණවටුන ප්‍රදේශ සහ කැළණිය හා පෑලියගොඩ නගරසභා ප්‍රදේශ ආවරණය කරමින් නව ජල සම්බන්ධතා 16,200ක් සහ ජලාපවහන සම්බන්ධතා 40,000ක් ස්ථාපිත කිරීම | 100 |
| • මහනුවර නගරයේ ජලාපවහන සම්බන්ධතා 9,302 ක් සහ ජල පිරිපහදුවක් ස්ථාපිත කිරීම | 2,250 |
| • අපජල කළමනාකරණය සඳහා මලාපවහන සම්බන්ධතා 1,635 ක් ලබාදීම සහ මොරටුව හා රත්මලාන ප්‍රදේශවල ජල පිරිපහදු පිහිටුවීම | 1,010 |

| | |
|---|---|
| • මුළු දිවයිනම ආවරණය වන පරිදි නව ජල සම්බන්ධතා 475,000 ක්, නව මලාපවහන සම්බන්ධතා 8,000 ක් සහ ජලයේ ගුණාත්මකභාවය වැඩි කිරීමේ අරමුණින් 2021 සිට 2026 දක්වා ක්‍රියාත්මක කරනු ලබන ධාරිතා වැඩි දියුණු කිරීමේ සහ බෙදා හැරීම් පුළුල් කිරීමේ ව්‍යාපෘතිය | 10,000 |
| • වතුකරයේ යටිතල පහසුකම් සංවර්ධනය - වතු පාසල් සඳහා ජල සම්පාදන සනීපාරක්ෂක පහසුකම් සැපයීම, දැනට පවතින ලයින් කාමර 500ක් අලුත්වැඩියා කිරීම, වතුකරයේ පාසල් 500ක් වැඩි දියුණු කිරීම, රැකියා විරහිත වතු තරුණ තරුණියන් 1000කට වෘත්තීය පුහුණුව ලබා දීම | 100 |
| • වතුකරයේ පාසලේ SMART පන්ති කාමරයක් පිහිටුවීම - SMART පන්ති කාමර 60 ක් ප්‍රතිසංස්කරණය කිරීම | 310 |
| • වතු නිවාස වැඩසටහන - වහල මට්ටමේ තිබෙන නිවාස ඒකක 526ක් සම්පූර්ණ කිරීම, අත්තිවාරම් මට්ටමේ නිවාස ඒකක 267ක් සම්පූර්ණ කිරීම, සහ නිවාස ඒකක 1,213ක් සඳහා යටිතල පහසුකම් (ජල සහ විදුලිය) සැපයීම | 500 |
| • ඉන්දියානු ආධාර නිවාස වැඩසටහන (අදියර 1) - නිවාස ඒකක 70 ක් සම්පූර්ණ කිරීම, නිම කරන ලද නිවාස සඳහා යටිතල පහසුකම් (ජලය සහ විදුලිය) සැපයීම | 225 |
| • ඉන්දියානු අරමුදල් සහිත නිවාස 10,000 වැඩසටහන - නිම කරන ලද නිවාස 1,200 ක් සඳහා යටිතල පහසුකම් (ජල සහ විදුලිය) සැපයීම, තවත් නිවාස ඒකක 1,000 ක් සඳහා මූලික කටයුතු සම්පූර්ණ කිරීම | 3,900 |
| • **යාපනය ජල සම්පාදන ව්‍යාපෘතිය - අයවැය යෝජනා අංක 27** | 250 |
| • වෙනත් මූලධන වියදම් | 7,509 |

රු. මි

| නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශය | 54,150 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **3,090** |
| **මූලධන වියදම්** | **51,060** |
| **පුනරාවර්තන වියදම්** | |
| • වැටුප් හා මෙහෙයුම් වියදම් | 2,196 |
| • වෙනත් පුනරාවර්තන වියදම් | 894 |
| **මූලධන වියදම්** | |
| • නාගරික නිවාස ඒකක 50,000ක් ඉදිකිරීම සහ පැල්පත්වාසීන්ට නිවසක අයිතිය ප්‍රදානය කිරීම (ඇපල්වත්ත, මාදම්පිටිය, රජවත්ත, සිරිල් පෙරේරා මාවත, බ්ලූමැන්ඩල් නිවාස, දෙමටගොඩ, කොළඹ 05 කාලිංග මාවත, කොළඹ 07 ටොරින්ටන් මාවත යන ප්‍රදේශ) | 15,470 |
| • සැමට නිවාස ( නාගරික, ග්‍රාමීය, අඩු ආදායම් ලාභී පවුල්, විරුසුමිතුරු සහ නිදන්ගත වකුගඩු රෝගයේ බලපෑමට ලක්වූ පවුල් ඇතුළත්ව) නිවාස ඒකක 18,528 ක් ඉදිකිරීම | 2000 |
| • නව නිවාස යෝජනා ක්‍රම ඉදිකිරීම සහ මැදි ආදායම් පවුල්වල නිවාස ගැටළු විසඳීම සඳහා ණය පහසුකම් ලබාදීම (රාගම සහ වාද්දුව ප්‍රදේශවල නිවාස ඒකක 1,671 ක් ඉදිකිරීම) | 10 |
| • උතුරු සහ නැගෙනහිර පළාත්වල ගැටුම් හේතුවෙන් අවතැන් වූ පුද්ගලයින් නැවත පදිංචි කිරීම සම්පූර්ණ කිරීම( නිවාස ඒකක ගණන 6,759) - **( අයවැය යෝජනා අංක 26 යටතේ 'අභ්‍යන්තර අවතැන්වූවන් සඳහා නිවාස ඉදිකිරීම' සඳහා වෙන් කරන ලද රු.මි. 500ක ප්‍රතිපාදන මෙහි ඇතුලත් කර ඇත)** | 2,500 |
| • මහජන උද්‍යාන හා පොදු පහසුකම්, ඇවිදීම් මංතීරු, නාගරික උද්‍යාන හා ජල උද්‍යාන, රථගාල් සහ බස් නැවතුම්, සාප්පු සංකීර්ණ හා ගොඩනැගිලි සංවර්ධනය කිරීම (සියක් නගර ව්‍යාපෘතිය) | 600 |
| • හෝමාගම ප්‍රදේශයේ තාක්ෂණ නගර සංවර්ධනය යටතේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 500 |
| • යාපනය නගර ශාලාව ප්‍රතිසංස්කරණය කිරීම | 400 |
| • අනුරාධපුර ලොලුගස්වැව නව නගරය සංවර්ධනය කිරීම අනවසර පදිංචි කරුවන් සඳහා නව නිවාස ලබාදී නිසිපරිදි පදිංචි කරවීම | 20 |
| • අනුරාධපුර සෝභිත හිමි ගම්මානය සඳහා නිවාස | 310 |
| • හදිසි ගංවතුර තත්ත්වයන් පාලනය කිරීම සඳහා ඇළ මාර්ග සහ කාණු නඩත්තු කිරීම සහ ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ සංස්ථාව මගින් ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති සම්පූර්ණ කිරීම | 600 |
| • බේරස් ගඟ වැසිජල අපවහන සහ පරිසර වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය ( ගංවතුර වැළැක්වීම සඳහා ජලාපවහන පද්ධතිය නඩත්තු කිරීම , හානියට පත් නිවාස සඳහා වන්දි ගෙවීම , නැවත පදිංචි කිරීමේ වියදම් දැරීම ) | 800 |
| • මහ කොළඹ නාගරික සංවර්ධන ව්‍යාපෘතිය (කොළඹ නගරය හා තදාසන්න ප්‍රදේශවල වැසි ජලය නිසා ඇතිවන ගංවතුර පාලනය හා හඳුනාගත් යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 292 |
| • අරුවක්කාලු ප්‍රදේශයේ සනීපාරක්ෂක බිම් පිරවුම් අංගනයක් ඉදිකිරීම සහ දුම්රිය යටිතල පහසුකම් භාවිතා කරමින් කැළණිය සිට අරුවක්කාලු දක්වා සංයුක්ත අපද්‍රව්‍ය ප්‍රවාහනය කිරීම | 5,500 |
| • නාගරික සංවර්ධන අධිකාරිය (යටිතල පහසුකම්) | 400 |

| | |
|---|---|
| • ඔලියමුල්ල සහ කොළොන්නාව වැසි ජල අපවහන සහ පරිසරය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය (ඇළවේලි, බෝක්කු , පාලම් සහ කාණු පද්ධති ප්‍රතිසංස්කරණය කිරීම , පොම්පාගාර ඉදිකිරීම) | 1 |
| • උතුරු සහ දකුණු පළාත්වල නිවාස 1,200ක් ඉදිකිරීම | 40 |
| • අඩු ආදායම් ආදායම්ලාභීන් සඳහා චීන ආධාර වැඩසටහන යටතේ නිවාස ඒකක 2000 ක් ඉදි කිරීම (පෑලියගොඩ, දෙමටගොඩ, මහරගම,මොරටුව සහ කොට්ටාව යන ප්‍රදේශ) | 3,200 |
| • **"කඳුරට දශකය" - ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන - අයවැය යෝජනා අංක 08** | 10,000 |
| • **පුනරීන් නගරය සංවර්ධනය කිරීම - අයවැය යෝජනා අංක 28** | 500 |
| • **බණ්ඩාරවෙල තොග එළවළු මධ්‍යස්ථානය වැඩිදියුණු කිරීම - අයවැය යෝජනා අංක 30** | 250 |
| • **විසල් මිහින්තලේ නගර සංවර්ධනය - අයවැය යෝජනා අංක 37** | 200 |
| • **ගාලු දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය - අයවැය යෝජනා අංක 41** | 250 |
| • වෙනත් මූලධන වියදම් | 7,217 |

රු. මි

| ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය | 3,718 |
|---|---|
| පුනරාවර්තන වියදම් | 1,186 |
| මූලධන වියදම් | 2,532 |
| **පුනරාවර්තන වියදම්** | |
| • වැටුප් හා මෙහෙයුම් වියදම් | 453 |
| • වෙනත් පුනරාවර්තන වියදම් | 733 |
| **මූලධන වියදම්** | |
| • කොළඹ වරාය නගරය සංවර්ධන ව්‍යාපෘතිය<br>කොළඹ ආර්ථික නගරයේ සීමාව තෙක් උපයෝගිතා සේවා ලබා දීම (විදුලිය, ජල සැපයුම සහ මලාපවහන බැහැර කිරීමේ පහසුකම්) | 1,550 |
| • අපනයනය සංවර්ධන මණ්ඩලය<br>ශ්‍රී ලංකාවේ අපනයනවලට අදාලව නව නිෂ්පාදන වැඩි දියුණු කිරීම, ප්‍රවර්ධනය සහ වෙළඳපොල පුළුල් කිරීම. | 300 |
| • විදේශීය ආයෝජකයින් ආකර්ෂණය කර ගැනීම සඳහා ආර්ථික කලාපවල පහසුකම් වැඩිදියුණු කිරීම<br>බිංගිරිය හා වගවත්ත යන ආර්ථික කලාපවල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 500 |
| • වෙනත් මූලධන වියදම් | 182 |

රු. මි

| වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය | 2,569 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **1,801** |
| **මූලධන වියදම්** | **768** |
| **පුනරාවර්තන වියදම්** | |
| • ආහාර සුරක්ෂිතතාව සඳහා ග්‍රාමීය අඩු ආදායම්ලාභී කාන්තා ව්‍යවසායකයින් සවිබල ගැන්වීමේ වැඩසටහන<br>මේ යටතේ අඩුආදායම්ලාභී කාන්තා ව්‍යවසායකයින් හඳුනාගෙන ග්‍රාමීය ප්‍රදේශවල අත්‍යවශ්‍ය භාණ්ඩ සාධාරණ මිලකට ලබා දීම හා ග්‍රාමීය මට්ටමින් ආහාර සුරක්ෂිතතාවය ඇති කිරීම | 100 |
| • වැටුප් හා මෙහෙයුම් වියදම් (අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු ඇතුලත්ව ) | 619 |
| • වෙනත් පුනරාවර්තන වියදම් (අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු ඇතුලත්ව) | 1,082 |
| **මූලධන වියදම්** | |
| • දඹුල්ල උෂ්ණත්ව පාලන ගබඩා සංකීර්ණය ඉදිකිරීම<br>රුපියල් මිලියන 1,389 ක වියදමින් දඹුල්ල ප්‍රදේශයේ නැවුම් එළවලු හා පළතුරු ගබඩා කිරීම සඳහා උෂ්ණත්වය හා ආර්ද්‍රතාවය පාලනය කරන ලද මෙට්‍රික් ටොන් 5,000 ක ධාරිතාවයෙන් යුතු ගබඩා සංකීර්ණයක් ඉදි කිරීම | 300 |
| • සහල් ගබඩා නවීකරණය කිරීම<br>ආහාර දෙපාර්තමේන්තුව සතුව පවතින කුරුණෑගල ගැට්ටුවාන ආහාර ගබඩා සංකීර්ණය අලුත් වැඩියා කිරීම | 10 |
| • **ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම සහ සුළු හා මධ්‍ය පරිමාණ ආහාර සැකසුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික සහ අනෙකුත් පහසුකම් සැලසීම - අයවැය යෝජනා අංක 46** | 250 |
| • වෙනත් මූලධන වියදම් (අමාත්‍යාංශය, දෙපාර්තමේන්තු ඇතුලත්ව) | 208 |

රු. මි

| කර්මාන්ත අමාත්‍යාංශය | 9,409 |
|---|---|
| **පුනරාවර්තන වියදම්** | **3,415** |
| **මූලධන වියදම්** | **5,994** |
| **පුනරාවර්තන වියදම්** | |
| • වැටුප් හා මෙහෙයුම් වියදම් | 2,671 |
| • වෙනත් පුනරාවර්තන වියදම් | 744 |
| **මූලධන වියදම්** | |
| • පේෂ කර්මාන්තයේ නියැලෙන්නන් ආර්ථික වශයෙන් සවිබල ගැන්වීම | 300 |
| • කාර්මික ජනපද සංවර්ධන වැඩසටහන යටතේ කාර්මික ජනපදයන්හි යටිතල පහසුකම් සංවර්ධනය කිරීම | 1,000 |
| • අපද්‍රව්‍ය අවම කිරීම, සම්පත් ප්‍රතිසාධනය, බලශක්ති ඉතිරිකිරීම් සහ පරිසර දූෂණය පාලනය සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කර්මාන්ත සඳහා අඩු පොලී ණය ලබා දීම (E-Friends II) | 1,000 |
| • ව්‍යවසායන් සඳහා ඔවුන්ගේ ඵලදායීතාව හෝ ඒවායේ ක්‍රියාකාරී මට්ටම ඉහළ නැංවීමට සහ ඔවුන්ගේ නිෂ්පාදනවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමට අඩු පොලී ණය ලබා දීම (SMILE III ) | 2,500 |
| • අත්‍යන්ත්‍ර සහ රෙදිපිළි කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා නව අත්‍යන්ත්‍ර ගම්මාන ( ගම්පහ, ගාල්ල, හම්බන්තොට, පුත්තලම, මහනුවර , කුරුණෑගල) සහ බතික් අත්‍යන්ත්‍ර කර්මාන්තය සඳහා පොදු පහසුකම් මධ්‍යස්ථාන ස්ථාපිත කිරීම | 80 |
| • ග්‍රාමීය සම්ප්‍රදායික කාර්මික ප්‍රවර්ධනය සඳහාවන යටිතල පහසුකම් සංවර්ධනය | 100 |
| • නිරවද්‍ය මැණික් කැපීම් පුහුණු ඒකකය ස්ථාපනය කිරීම | 20 |
| • වෙළඳපොළ ප්‍රවර්ධනය, තත්ත්ව සහතික කිරීම සහ නිපුණතා සංවර්ධනය සඳහා ආංශික සංවර්ධන වැඩසටහන යටතේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම | 200 |
| • **අත්‍යන්ත්‍ර, පේෂ කර්මාන්ත සංවර්ධනය - අයවැය යෝජනා අංක 25** | 300 |
| • වෙනත් මූලධන වියදම් | 794 |

රු. මි

| | |
|---|---|
| **ධීවර අමාත්‍යාංශය** | **7,500** |
| **පුනරාවර්තන වියදම්** | **2,581** |
| **මූලධන වියදම්** | **4,919** |
| **පුනරාවර්තන වියදම්** | |
| • ධීවර ප්‍රජාව සහ සමුද්‍රීය ධීවර කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සහ සම්බන්ධීකරණ කටයුතු | 65 |
| • 'දියවර දිරිය' ණය යෝජනා ක්‍රමය සඳහා පොලී ගෙවීම | 13 |
| • වැටුප් හා වේතන | 740 |
| • වෙනත් පුනරාවර්තන වියදම් (ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව ද ඇතුලත්ව) | 1,763 |
| **මූලධන වියදම්** | |
| • ගන්දර ධීවර වරාය ඉදිකිරීම<br>මාතර දිස්ත්‍රික්කයේ ධීවර පවුල් 1000ක් ප්‍රතිලාභ ලබයි. පාදක ප්‍රදේශය හෙක්ටයාර් 4.8 ක් වන අතර භූමි ප්‍රමාණය හෙක්ටයාර් 3.82 කි | 3,200 |
| • මයිලිඩ්ඩි ධීවර වරාය සංවර්ධනය කිරීම<br>යාපනයේ ධීවර පවුල් 690ක් ප්‍රතිලාභ ලබන අතර පාදක ප්‍රදේශය හෙක්ටයාර 3.65කි | 200 |
| • මිරිදිය ජලාශ සඳහා මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරීම<br>සෘජු සහ වක්‍ර ප්‍රතිලාභීන් සංඛ්‍යාව 100,000ක් පමණ වේ | 200 |
| • කලපු සංවර්ධනය සහ සංරක්ෂණය කිරීම<br>ආරුගම්බේ, නන්දිකඩාල්, නයාරු ලංකාපටුන, කොග්ගල, රැකව, ගරාදූව(මිරිස්ස), මුන්දලම, කොක්කිලායි සහ මීගමුව සහ හලාවත කලපු ආශ්‍රිතව ජීවත්වන ධීවර ජනතාවට ප්‍රතිලාභ හිමිවේ | 100 |
| • රැකව නැංගුරම්පොළ ඉදිකිරීම<br>වෙරළ ඛාදනය අවම කිරීමට පියවර ගෙන ඇති අතර හම්බන්තොට ධීවර පවුල් 645ක් ප්‍රතිලාභ ලබයි | 100 |
| • මාවැල්ල නැංගුරම්පොළ ඉදිකිරීම<br>වෙරළ සුපෝෂණය කිරීමට සහ වෙරළ ඛාදනය අවම කිරීමට පියවර ගෙන ඇති අතර හම්බන්තොට ධීවර හා සංචාරක පවුල් 246ක් ප්‍රතිලාභ ලබයි | 100 |
| • ශ්‍රී ලංකාවේ වෙරළාසන්න ජල තීරයේ මත්ස්‍ය වාසස්ථාන වැඩි දියුණු කිරීම<br>ගම්පහ, ගාල්ල, මාතර, අම්පාර සහ මන්නාරම් දිස්ත්‍රික්කවල වෙරළබඩ කලාපයේ ධීවර ප්‍රජාව ප්‍රතිලාභ ලබයි | 40 |
| • සෝදිසි මෙහෙයුම් මධ්‍යස්ථාන සඳහා නව 250W SSB ගුවන්විදුලි යන්ත්‍ර මිලදී ගැනීම<br>හම්බන්තොට, මාතර, ගාල්ල, කළුතර, කොළඹ, මඩකළපුව, යාපනය, ත්‍රිකුණාමලය, කල්මුණේ සහ පුත්තලම යන වෙරළබඩ ප්‍රදේශවල ජීවත්වන විවිධ ආර්ථික ක්‍රියාකාරකම්වල යෙදෙන 100,000 කට වැඩි පුද්ගලයින් ප්‍රමාණයක් මේ තුලින් ප්‍රතිලාභ ලබයි | 25 |
| • දොඩන්දූව, අම්බලන්ගොඩ, හික්කඩුව සහ වාලච්චේන ධීවර වරායන් සඳහා පර්යේෂණ සහ ශක්‍යතා අධ්‍යයන සහ පාරිසරික අනුමැතිය ලබා ගැනීම | 20 |

| | |
|---|---|
| • 'ඔරු වැල්ල' පුවත්පත සහ 'ධීවර නවෝදය' ගුවන් විදුලි වැඩසටහන | 8 |
| • **උතුරු කලාපයේ ධීවර කර්මාන්ත සංවර්ධනය - අයවැය යෝජනා අංක 23** | 500 |
| • වෙනත් මූලධන වියදම් | 426 |

රු. මි

